**ශ්‍රම වාසනා අරමුදල - 2023**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 6(2) වගන්තිය සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 | පාරිතෝෂික දීමනා ගණනය කිරීම, වෙන් කිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ගිණුම්කරණ ප්‍රමිත හා පනතේ විධිවිධානයන්ට අනුකූලව සිදුකර නොතිබුණි. | 1993 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව ශ්‍රම වාසනා අරමුදල විසින් සේවකයින් සඳහා පාරිතෝෂික වෙන්කිරීම් සිදු කරන ලදී.<br>එහිදී සේවකයාගේ සේවා කාලය සහ අවසන් වරට ලද වැටුපෙන් භාගයක් පදනම් කොට ගනිමින් පාරිතෝෂික ගණනය කිරීම සිදු කරන ලදී.ඒ අනුව ශ්‍රම වාසනා අරමුදල විසින් 2019 වර්ෂයේ සිට සේවකයාගේ සේවා කාලය පදනම් කොට ගනිමින් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කරන ලදී. පාරිතෝෂික වෙන් කිරීමේදී සිදු වී ඇති ඌණතාවය ගැලපීම ඉදිරියේදී පාරිතෝෂික වෙන්කිරීමේදී සිදු කරන බව. | පනත හා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 2021/01 දරන මෙහෙයුම් අත්පොතෙහි 5.4 සහ 2022 අගෝස්තු 08 දිනැති අංක 04/22 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස අරමුදල විසින් 2023 වර්ෂයේදී කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහනක් සහ වේදිකා නාට්‍යයක් සඳහා ප්‍රචාරක අනුග්‍රහ ලෙස රු.545,000 ක මුදලක් වැයකර තිබුණි. | 2022 වර්ෂයේදී රට තුල ආර්ථික වශයෙන් අස්ථාවරව තිබූ අවධියේදී රටේ තිබෙන දැඩි කම්කරු නීති දැඩි කම්කරු ප්‍රතිපත්ති ලංකාව තුලට විදේශ විනිමය රැගෙන ආයෝජකයින් රට තුලට නොපැමිණීමට යම් බාධාවන් වී ඇත. එහිදී රජය ගත් තීරණය වූයේ විදේශ විනිමය ලබා ගැනීම සඳහා ආයෝජන ප්‍රවර්ධන වැඩි කර ගැනීමට යම් ලිහිල් කම්කරු නීති පද්ධතියක් ඇති කර ගැනීම වේ. ඊට පෙර මහජනතාවට එක් එක් කාණ්ඩයේ කම්කරු පන්ති නියෝජනය වනපරිදි අදහස් ලබා ගනිමින් ඔවුන් දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශයේ අනෙකුත් ආයතන එක්ව මෙම දායකත්වය ලබාදෙන ලද බව. | නීතිරීති විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | | | |
| (i) | 3.3 උප වගන්තිය හා 3.4 (2උ) උප වගන්තිය | රීති සෑදීම පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටි සහ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සෑදීමට බලය ලබා දී තිබුණද202 3 දෙසැම්බර් 31 දින වන විටත් අදාල රීති පිළියෙල කර නොතිබුණි. එසේම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ ඇති නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, අදාල රීති 2023 දෙසැම්බර් 31 .දිනටත් පිළියෙල කර නොතිබුණි | ශ්‍රම වාසනා අරමුදල 2020.08.09 වන දින ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද 2187/27 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මුදල් අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.එම කාලය තුළදී මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට අදාළ රීතීන් ගැසට් කිරීමට යොමු කරන ලදී. රීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් රේඛීය අමාත්‍යාංශය 2024.04.09 දින මුදල් අමාත්‍යාංශය සමඟ පැවැති සාකච්ඡාවකදී ගත් අවසන් තීරණය වූයේ ශ්‍රම වාසනා අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ගිවිසුම සම්බන්ධව අර්ථනිරූපනයක් ලබා ගැනීම සුදුසු බවත් එම අර්ථනිරූපනය ලද පසු අදාල රීති හා අදාල සංශෝධනයන් එකවර කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට තීරණය කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | 13. උප වගන්තිය 1 13 හා. ( උප (2අ වගන්තිය | ලොතරැයි පැවැත්වීම. අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේදී පවත්වනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකගතාවයකට එළඹ නොතිබුණි . අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇති කර ගන්නා එකඟවීමට වෙනත් කරුණු අතර,<br>• ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව,<br>• ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි පිළිබඳව,<br>• ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය | 2022.08.26 දින ලොතරැයි මණ්ඩලය වෙත යවන ලද ශ්‍රම වාසනා අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර යෝජිත ලොතරැයි ගිවිසුම සඳහා එකඟ වීම් සහ එකඟ නොවීම් ඇතුළත්ව සකස් කරන ලද ලිපියක් 2022.10.10 දින ලොතරැයි මණ්ඩලය විසින් ශ්‍රම වාසනා අරමුදල වෙත එවන ලදී.එය අධ්‍යක්ෂ මණ්ඩලයට හා විගණන හා කළමනාකරණ කමිටුවට යොමුකර සාකච්ඡා කරන ලදී.අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ලිපිය ප්‍රමාණවත් බව තීරණය කරන ලද බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව එකඟතාවය න්ට එළඹිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයන්ට එළඹ නොතිබුණි . | | |
| (iii) | 14. උප වගන්තිය 1 | රීති සැකසීම - මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මගින් රීති සෑදීමේදී බලය දී ඇති හෝ රීති සෑදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද 2023 දෙසැම්බර් දින වන 31 විටත් එබඳු රීති පිළියෙල කර .අනුමත කරගෙන නොතිබුණි | 2024.04.09 දින මුදල් අමාත්‍යාංශය සමඟ පැවැති සාකච්ඡාවකදී ගත් අවසන් තීරණය වූයේ ශ්‍රම වාසනා අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ගිවිසුම සම්බන්ධව අර්ථනිරූපනයක් ලබා ගැනීම සුදුසු බවත් එම අර්ථනිරූපනය ලද පසු අදාල රීති හා අදාල සංශෝධනයන් එකවර කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට තීරණය කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.35,157,333 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,927,981 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,229,352 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුරක් පැවතියද ඊට අවශ්‍ය නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය ඉටුවී නොතිබුණි. | 2023.11.29 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් අභ්‍යන්තර විගණකයෙකු පත් කර ඇත්තේ විගණන කටයුතු සිදු කිරීමේදී ආයතනයේ ලිපි ගොනු එම දෙපාර්තමේන්තුව වෙත රැගෙන ගොස් විගණන කටයුතු සිදු කිරීමට යටත්ව වීම නිසා එය ආයතනයේ ලිපි ගොනු වල සුරක්ෂිතභාවයට හානියක් විය හැකි බැවින් එම කරුණට යටත්ව පත් වීම පිළි ගැනීමට නොහැකි බවත් වෙනත් පත් වීමක් සිදු කර ගන්නා ලෙසත් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් උපදෙස් ලබා දෙන ලදී.ඒ අනුව 2024.03.14 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශයේ හෝ ඒ යටතේඇති ආයතන වල සුදුසු නිලදාරියෙකු ඒ සඳහා පත් කර එවන මෙන් දන්වා යවා ඇති බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රම වාසනා අරමුදලේ ක්‍රියාත්මක වැඩසටහන් සඳහා අවශ්‍ය පාසල් බෑග් සහ පොත් මිලදී ගැනීම සඳහා රු.3,599,679 ක් වියදම් කර තිබූ අතර බෑග් සපයන ආයතනය විසින්ම පොත් ඇසුරුම්කර වැඩසටහන් සඳහා රැගෙන යාම 2023 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මකව පැවති අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් නිසි අභ්‍යන්තර පාලනයක් හා අධීක්ෂණයක් පවතින බවට නිරීක්ෂණය නොවීය. | ශ්‍රම වාසනා අරමුදලේ අඩු කාර්ය මණ්ඩලය යටතේ පාසල් උපකරණ පොත් බෑග් වලට ඇසිරීමේ කටයුතු කර ගැනීම අප කාර්යමණ්ඩලයට අපහසු වූ බැවින් ශ්‍රම වාසනා අරමුදලේ මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ බෑග් සපයන ආයතනය වෙත භාරදී ඔවුන් ලවා ඇසිරීම් කටයුතු සිදු කරන ලදී.<br>එසේම මෙම බෑග් බෙදා දීමට පෙර අහඹු පරීක්ෂාවක් ලෙස බෑග් නියදි කිහිපයක් බෑග් ප්‍රමාණය හා බෑග් වල අඩංගු පොත් ප්‍රමාණය නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බෙදා හරිනු ලබන බව හා මේ වන විට එය නිසි අභ්‍යන්තර පාලනයක් හා අධීක්ෂණයක් ඇතිව සිදු කරනු ලබන බව. | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |